(05)

(1) යහ ගුණාංග හැඳින්වීමට ඔබ ඉගෙනගත් අරාබි පද 4 ක් ලියන්න.

(2) ඔබ තව්බා කරන විට අනුගමනය කළයුතු කොන්දේසි කවරේද?

(3) වහී ගෛරු මත්ලුව් යන්න උදාහරණ හතරක් දක්වමින් පැහැදිලි කරන්න.

(06)

(1) ඉබාදත් යන පදයේ තේරුම කෙටියෙන් ලියන්න.

(2) ඉබාදත් හි අරමුණු 3 ක් ලියන්න.

(3) තයම්මුම් සහ ජබීරත් යන පදවල තේරුම් කෙටියෙන් පැහැදිලි කරන්න.

(07) පහත සඳහන් කරුණුවලින් 2 ක් පිළිබඳ පැහැදිලි කරන්න.

(4) උස්මාන් (රළි) තුමාගේ කාලයේ අල් කුර්ආනය එක්රැස් කිරීම.

(5) අජ්නබි - මහ්රම් සීමාවන් අනුගමනය කරමු.

(6) සලාතයේ මෙලොව සහ පරලොව ප්‍රයෝජන

(7) ශාරීරික ව්‍යායාම් පිළිබඳ ඉස්ලාමීය මඟ පෙන්වීම්.

9276

සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

තෙවන වාර ඇගයීම
ஆண்டு இறுதி மதிப்பீடு - 2019
Year End Evaluation

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 10 | විෂයය / பாடம் / Subject: සිංහල සාහිත්‍ය රසාස්වාදය | පත්‍රය / வினாத்தாள் / Paper: I | පැය / மணித்தியாலம் / Hours: 03 |

සැලකිය යුතුයි

- I කොටසෙහි, I, II ප්‍රශ්නවලටත් II කොටසෙහි 03 වන ප්‍රශ්නයටත් III කොටසෙහි 4, 5, 6, 7 ප්‍රශ්නවලින් තෝරා ගත් ප්‍රශ්න දෙකකටත් උත්තර ලියන්න.

## I කොටස

(01) අංක (I) සිට (v) තෙක් ඇති කොටස් කියවා අසා ඇති (අ, ආ) ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.

(i) "යව අපගේ ගර්භයෙහි තිබූ ස්වර්ණ රූපය ගෙනෙව"
(අ) මෙම ප්‍රකාශය කළේ කවුරුන් ද?
(ආ) මෙසේ නියෝග කළේ කා හටද?

(ii) ..................................................................
..................................................................
පි පෙ ත ත් ගිරි මුදුන හෙළ් මැලි පියුමු' පුල
බොරු නැත් තෙ ම ය මහතුන් පැවසූ තෙපුල
(අ) මෙම පද්‍යය සම්පූර්ණ කරන්න.
(ආ) මෙහි සඳහන් සුදන ගුණය කුමක් ද?

(iii) "ඩිංගිරිගෙන් බත් ඉල්ලාගෙන කාලා නිදාගන්න"
(අ) මේ බස් කියන්නේ කවුරුන් ද?
(ආ) මෙම කෙටි කතාව ලියූ ලේඛකයාගේ නම ලියන්න.

(iv) නිල් පැහැයක් නැතත් මේ වැලි පොළොව පිට
උදයට පෙනේ බොල් පිනි බිඳු පබලු ඇට
(අ) මෙම පද්‍ය කොටස අයත් පද්‍ය පන්තියේ නම කුමක් ද?
(ආ) මෙහි නිර්මාණකරුවා කවුරුන් ද?

(v) "මං හීනෙන් දැක්කා මගේ උඩු ඇන්දේ දතක් වැටුණා."
(අ) මෙම ප්‍රකාශය උපුටා ගත්තේ කුමන කෘතියෙන් ද?
(ආ) එම කතුවරයාගේ වෙනත් කෘතියක නම සඳහන් කරන්න.

(ලකුණු 4 x 5 = 20)

(02) පහත සඳහන් පැදි පෙළ කියවා දී ඇති ප්‍රකාශ උපයෝගී කොට ගෙන රසාස්වාදයක් ලියන්න.

ගන්තුන තුලානේ අලියා වැටුණු වැ වේ
සුන්දර හාමි එතරම් පොහොසතෙක් නො වේ
තුන්ලාහකම බිම වැඩකර දියෙන් වැ වේ
රන් වන් කරල් බර වී දැන් බිමට නැ වේ

ඔහුගේ ගමට මා ගිය ඒ පළමු වර
තවමත් සිතේ ඇත අමතක නොවන යුර
හේනට ගොසින් ගෙන් හුවක් තරම දුර
එනවා දිටිමි මිටි බැඳගෙන වියලි දර

දර ටික තබා සෙවණැති පලු ගසක යට
පිස දම දමා දාඩිය එන නළල පිට
මා එන තුරුම සිට පෙන්වූ සිනහ කට
තවමත් පෙනේ දුක් දොම්නස් අතර මට

පෙර දැක නොමැති මුත් සුන්දර හාමි විසින්
මගේ තොරතුරු ඇසූ හැටි හිතවතකු ලෙසින්
ගෙඩියක් කඩාගෙන ගෙමිදුල තැඹිලි ගසින්
පිළිගැන්විය මට සොම්නස් පිරුණු ඇසින්

පොල් දෙහි දොඩම් ගස් තුන හතරකි වත්තේ
දුප්පත් කමයි හැම තැන ලකුණුව ඇත්තේ
කෙලෙසද කියා කළ ගුණ සැලකිය යුත්තේ
දුන් සත පහනවත් ඔහු නැත පිළි ගත්තේ

ආගන්තුකව එන කෙනෙකුට පුරුදු නැති
හිතවත් කමින් සැලකූ යුතුකමය සිති
ඔහු වෙත මුදලකින් මා කළ හැටිය තුති
සිහිවී මගේ කම්මුල රතු පැහැය ගති

(i) මෙම පද්‍ය පන්තියේ රචකයා යොදාගෙන ඇති අත්දැකීම කෙබඳු දැයි විස්තර කරන්න.

(ii) කවියට අනුව සුන්දර හාමිගේ ජීවිතයෙන් ඔබ දකින යහපත් ගති ලක්ෂණ කෙටියෙන් ලියා දක්වන්න.

(iii) කවියා කවි පන්තිය මගින් ගැමි පරිසරයේ ස්වභාවය පිළිබඳ පවසා ඇති කරුණු දෙකක් සඳහන් කරන්න.

(iv) මෙම පද්‍ය පන්තිය නිර්මාණය කිරීම සඳහා කවියා යොදාගත් බස්වහර කෙතරම් උචිත දැයි පැහැදිලි කරන්න.

(v) 'මෙම පද්‍ය පන්තියේ ගැමි ජන ජීවිතය මානව දයාවෙන් යුතුව අලංකාර ලෙස ඉදිරිපත් කරයි' ඔබේ අදහස් දක්වන්න.

(ලකුණු 5 + 5 + 5 + 5+ 5 = 25)

## II කොටස

(03) පහත දැක්වෙන ගද්‍ය - පද්‍ය කොටස් දෙකින් **එක කොටසකට පමණක්** උත්තර සපයන්න.

"පුත, ස්ත්‍රීහු නම් නොයෙක් වංචා දනිති." යනාදීන් අවවාද කියා මග දී අනුභව කරන පිණිස අනගි රසයෙන් යුක්ත වූ රාජභෝජනය රන්මුඩමක පුරා දුන්හ. එසඳ මහා බෝධිසත්වයෝ මෑණියන් තුන්යලක් පැදකුණු කොට පසග පිහිටුවා වැඳ "ජීවත්ව උනිම් නම් සැපසේ අවුත් දකිනෙමි වේදැ" යි කියා අවසර ඉල්වා ගෙන ශ්‍රී යහන් ගබඩාවට වැද දුනුමුගුරු කඩු කොන්ත සොටි යන පඤ්චායුධ සන්නද්ධව ගෙන බත් මුඩම හා සමඟ කහවනු දහසකුත් පයියෙහිලා ගෙන කොකනද නම් වීණාව අතින් ගෙන නුවරින් පිටත්ව මහට පිළිපන්ව මහත් වූ බලවීර්ය ඇති මහාබෝධිසත්වයෝ එදවස් දාවල් බතට පනස් යොදුන් මහ ගෙවා ගෙන ගොස් බත අනුභව කොට පස්වරු භාගයෙහි තුබූ පනස් යොත්න ගෙවා ගොස් සවස් වේලෙහි පැන් සනහා සාගල නුවරට වන්හ.

(i) මෙහි සඳහන් වන පරිදි මහා බෝධිසත්වයෝ කුමක් සඳහා පිටත් වන්නේ ද?

(ii) මහාබෝධිසත්වයෝ තම අභිප්‍රායන් ඉටුකර ගැනීම සඳහා ගන්නා උත්සාහයයන් තුනක් කෙටියෙන් දක්වන්න.

(iii) මෙම කතාවේ සඳහන් පබවති කුමරියගේ චරිත ලක්ෂණ තුනක් ලියා දක්වන්න.

(iv) අවසානයේ මහාබෝධිසත්වයන්ගේ අභිප්‍රාය ඉටුවන්නේ කෙසේ ද?

(ලකුණු 5+ 5+5+10=25)

**නැතහොත්,**

කො තෙ ක් වෙහෙස ලදුවත් සුදනෝ පවර
උ ද ක් ලොව සතුන් සිත දුක් කෙරෙති දුර
ප ස ක් රාහු මුව පත් වෙමිනි බිය කර
අ නි ක් පසින් ලොව හෙළි කෙරෙය හිමකර

කු රි රු ගොර සපුන්ගේ දළ'ගෙහි විසය
ම දු රු මැසි කැලන්ගේ තුඩ'ගෙහි විසය
රු දු රු නුහුසුවන්ගේ වල'ගෙහි විසය
න පු රු දුදනන්ගෙ සියල'ගෙහි ම විසය

නැණැ ති දනන් හට මඳ ගුණයක් කළ ද
ප ව ති ගල කෙවු අකුරක් මෙන් නිබඳ
වි ම ති දනන් හට කළ කිසි ගුණ නොමඳ
එ නැ ති වේය දිය පිට ඇඳි ඉරක් ලෙද

අමිත ගුණ නුවණ යුතු උතුමෝ පබඳ
අනත වෙහෙස ලදුවත් නො ම වෙති දුහඳ
දිගති පතළ සුවදැති සොඳ සඳුන් කඳ
සිඳිත මඩිත එක ලෙස පැතිරෙයි සුවඳ

(i) සුදන ගුණය කියාපෑම සඳහා යොදාගත් උදාහරණ ලිහිල් බසින් ලියන්න.

(ii) කවියා උපදේශ පැහැදිලි කිරීම සඳහා සත්ත්ව චරිත හා ඒවායේ ක්‍රියාකාරකම් යොදා ගෙන ඇති අයුරු පහදන්න.

(iii) " සාමාන්‍ය ජනයාට තේරෙන සරල භාෂාව භාවිතය නිසා "සුභාෂිතය" පොදු උපදේශ කාව්‍යයක් ලෙස සමාජය තුළ ජනප්‍රිය විය". මේ අදහස කෙටියෙන් විස්තර කරන්න.

(iv) "මෙම පද්‍ය රචනයෙන් කවියා අපේක්ෂා කළේ යහපත් සමාජයක් ගොඩනැගීමයි". උදාහරණ දක්වමින් ඔබේ අදහස් ලියා දක්වන්න.

(ලකුණු 5+5+5+10 =25)

## III කොටස

- 4, 5, 6, 7 ප්‍රශ්න වලින් තෝරාගත් ප්‍රශ්න දෙකකට පමණක් පිළිතුරු ලියන්න.
- (එක පිළිතුරකට වචන 150 ක් පමණ තිබීම සෑහේ)

(04) කුස ජාතකය අපූර්ව වූ වාග් චිත්‍ර මවයි. එවන් අවස්ථා **තුනක්** උදාහරණ ලෙස ගනිමින් මෙම මතය පහදන්න.

(05) මිනිසාගේ ඇතැම් ක්‍රියාකාරකම් සත්ව සංහතියේ පැවැත්මට ද තර්ජනයක් වී ඇති බව "ඇත් ගාලේ දරු පෙම" පද්‍ය පන්තියෙන් විස්තර කෙරෙයි. නිදසුන් **තුනක්** ඇසුරින් ඔබේ අදහස් දක්වන්න.

(06) "ජන කවියා අවස්ථාවට උචිත ලෙස නිර්ව්‍යාජ අත්දැකීම් කාව්‍ය නිර්මාණයට යොදාගෙන තිබේ" අදාළ පාඩමේ නිදසුන් **තුනක්** මගින් පැහැදිලි කරන්න.

(07) "වෙසක් පහන" කතුවරයා ළමා මනස නිරූපණය කිරීමෙහිලා දැක් වූ කුසලතාව නිදසුන් **තුනක්** සහිතව විමසීමක යෙදෙන්න.

(ලකුණු 15 x 2 = 30)